# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2493/37 - 2026 ජුනි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2026.06.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත ) 7 වැනි වගන්තිය සමග කියවිය යුතු 29 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන රෙගුලාසි

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 ජුනි මස 18 වැනි දින,
කොළඹ දී ය.

**රෙගුලාසි**

**1. උද්ධෘත**

මෙම රෙගුලාසි 2026 අංක 02 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් විදේශ රට වලට අරමුදල් ප්‍රේෂණය කිරීම) රෙගුලාසි යනුවෙන් හැඳින්විය යුතු අතර, 2026 ජුනි මස 20 වැනි දින සිට බලපවත්වන පරිදි ක්‍රියාත්මක විය යුතු ය.

**2. ආරක්ෂණ විධිවිධාන**

2.1 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් පළ කරන ලද, විදේශ විනිමය පනත යටතේ පනවන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) රෙගුලාසි, ඒ යටතේ සිදු කරන ලද යම් කටයුත්තකට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබෙයි.

2.2 මුදල් අමාත්‍යවරයා විසින් පනතේ 22 වැනි වගන්තිය යටතේ, ප්‍රතිමුඛ ප්‍රේෂණ සීමා කරමින් පනවන ලබන ඕනෑම නියෝගයක්, ඉහත සඳහන් රෙගුලාසි අවලංගු කිරීම සහ මෙම රෙගුලාසි නිකුත් කිරීම යන කරුණු නොතකා, එම නියෝගයේ කාලසීමාව තුළ බලාත්මක විය යුතු ය.

**3. විගාමිකයන් විසින් විදේශ රට වලට අරමුදල් ප්‍රේෂණය කිරීම**

3.1 මෙම රෙගුලාසි සම්බන්ධ අරමුණු සඳහා, "විගාමිකයා" යන්නෙන්;

3.1.1 වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයෙක්; හෝ

1A - PG 7755 — 403 (2026/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.1.2 වෙනත් රටක පුරවැසිභාවය ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයෙක්; හෝ

3.1.3 තම මව හෝ පියා ශ්‍රී ලංකාවේ උපත ලද, ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියෙක්; හෝ

3.1.4 අ) තම මව හෝ පියා ශ්‍රී ලංකාවේ උපත ලද; සහ

ආ) තම උපත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති,

ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන තැනැත්තෙක් සහ 3.1.1, 3.1.2, 3.1.3 සහ 3.1.4 යන ඡේදවල සඳහන් තැනැත්තන් වර්ග යටතට ගැනෙන බාලවයස්කාර දරුවන් ද ඇතුළත් වේ.

**3.2 විගාමිකයන් විසින් විදේශ රට වලට අමුදල් ප්‍රේෂණය කිරීම සඳහා ඇති සුදුසුකම්**

3.2.1. වයස අවුරුදු දහඅටක් (18) හෝ ඊට වැඩි ඕනෑම විගාමිකයෙක්, මෙම රෙගුලාසිවල නියම කර ඇති සීමා, නියම සහ කොන්දේසි වලට යටත්ව, ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීම මඟින්, විදේශ රට වලට අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

3.2.2. විගාමිකයන් විසින් විදේශ රට වලට ප්‍රේෂණ සිදු කළ හැක්කේ ඔවුන් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන අවස්ථාවකදී (මුල් වතාවට හෝ පසු වතාවක) හෝ විගාමිකයා විදේශ රටක නේවාසිකව සිටින අතරතුරදී පමණි.

**3.3 විගාමිකයන් විසින් විදේශ රට වලට සිදු කරන ප්‍රේෂණ සඳහා අනුමත අරමුදල් ප්‍රභව**

3.3.1 මෙම රෙගුලාසි වල 3.4 වැනි ඡේදය යටතේ දක්වා ඇති, 'සංක්‍රමණික දීමනාවට' (Migration Allowance) යටත් නොවී, විගාමිකයෙක් විසින් පහත සඳහන් අරමුදල් විදේශ රට වලට ප්‍රේෂණය කළ හැකි ය.

(අ) විගාමිකයෙක් රැකියාවකින් ලද ප්‍රතිලාභ සහ විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව ජංගම ආදායම්.

(ආ) විගාමිකයෙක්ට හිමි වූ හෝ එම තැනැත්තාට උරුම වූ හෝ තෑගි වශයෙන් ලැබුණු, ශ්‍රී ලංකාවේ බැංකු ගිණුම්වල පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය.

(ඇ) පනතේ හෝ අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ විධිවිධාන වලට යටත්ව, අනේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද අරමුදල් උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද අවසරලත් ආයෝජනවලින් විගාමිකයන් හට උරුම වූ හෝ තෑගි වශයෙන් ලැබුණු ප්‍රාග්ධන ලැබීම්.

3.3.2 මෙම රෙගුලාසි වල 3.4 වැනි ඡේදයේ දක්වා ඇති, 'සංක්‍රමණික දීමනාවට' යටත්ව, විගාමිකයෙක් විසින් පහත සඳහන් අරමුදල් විදේශ රට වලට ප්‍රේෂණය කළ හැකිය.

(අ) ශ්‍රී ලංකාව තුළ පවතින ශ්‍රී ලංකා රුපියල් භාවිතයෙන් විගාමිකයා විසින් අත්පත් කරගත් යම් වත්කමකින් සහ මෙම රෙගුලාසිවල පහත 7 ඡේදයේ අවසර ලබා දී ඇති ආයෝජන වලින් ලැබෙන ප්‍රාග්ධන ලැබීම්.

(ආ) ඉහත 3.3.1 වැනි ඡේදයේ (ආ) සහ (ඇ) හි දක්වා ඇති වත්කම් හැරුනු කොට විගාමිකයාට උරුම වී ඇති ඕනෑම වත්කමකින් ලැබුණු ප්‍රාග්ධන ලැබීම්.

(ඇ) ඉහත 3.3.1 වැනි ඡේදයේ (ආ) සහ (ඇ) හි දක්වා ඇති වත්කම් හැර තම ආසන්නතම පවුලේ සාමාජිකයෙකුගෙන් විගාමිකයාට තෑගි ලෙස ලැබුණු වත්කම් වලින් ලැබුණු ප්‍රාග්ධන ලැබීම්.

**3.4 අවසරලත් සංක්‍රමණික දීමනාව**

3.4.1 එක් විගාමිකයෙක් සඳහා ලිත් වර්ෂයකදී ප්‍රේෂණය කළ හැකි උපරිමය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 100,000 කට යටත් ව, ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 200,000 ක හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඒ හා සමාන ප්‍රමාණයක ආරම්භක සංක්‍රමණික දීමනාවක් හිමි වෙයි.

3.4.2 2017 නොවැම්බර් 20 වැනි දිනට පෙර අදාළ ආරම්භක සංක්‍රමණික දීමනාවෙන් කොටසක් ලබාගත් විගාමිකයන් සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 150,000 ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඒ හා සමාන ප්‍රමාණයක් දක්වා වූ ආරම්භක සංක්‍රමණික දීමනාවෙන් ඉතිරි ශේෂය ලබා ගත හැකි ය.

3.4.3 3.4.1 වැනි ඡේදයේ හෝ 3.4.2 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි ආරම්භක සංක්‍රමණික දීමනාව සම්පූර්ණයෙන් ලබා ගත් දිනයේ සිට මාස දොළහක් (12) ගතවීමෙන් පසුව පමණක්, ලිත් වර්ෂයක් සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 30,000 ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඒ හා සමාන ප්‍රමාණයක වාර්ෂික සංක්‍රමණ දීමනාවක් හිමි වෙයි.

3.4.4 අදාළ ලිත් වර්ෂය පුරාවටම ශ්‍රී ලංකාව තුළ බැංකු ගිණුම් වල අදාළ අරමුදල් පවත්වාගෙන ගොස් ඇත්නම්, වාර්ෂික සංක්‍රමණ දීමනාව පහත දක්වා ඇති පරිදි සමුච්චිත කර ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කළ හැකි ය.

(අ) වර්ෂ 2013 සිට 2016 දක්වා, වාර්ෂික සංක්‍රමණ දීමනාව වසරකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 20,000 ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඒ හා සමාන ප්‍රමාණයක් බැගින්.

(ආ) වර්ෂ 2017 සිට, වාර්ෂික සංක්‍රමණ දීමනාව වසරකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 30,000 ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඒ හා සමාන ප්‍රමාණයක් බැගින්.

**4. සංක්‍රමණික ප්‍රේෂණ ලෙස විදේශ රට වලට මුදල් යැවීමේ ක්‍රියා පටිපාටිය**

4.1 3.3 වැනි ඡේදයේ දක්වා ඇති ශ්‍රී ලංකා රුපියල් වලින් විගාමිකයෙක්ට ලැබෙන අරමුදල්, එම පුද්ගලයන් නමින් ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙඳුන් සමග විවෘත කර පවත්වාගෙන යනු ලබන ‘විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම්’ (Emigrants’ Transaction Rupee Accounts (ETRAs) හෝ ‘විගාමිකයන්ගේ රුපියල් ගිණුම්’ (Emigrants’ Rupee Accounts (ERAs) වෙත බැර කළ යුතු ය.

4.2 විගාමිකයකු විසින් ඉහත 4.1 වැනි ඡේදය යටතේ දක්වා ඇති ඕනෑම අරමුදලක් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීම සහ/හෝ පහත 4.4 වැනි ඡේදය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන එම විගාමිකයාගේ ගිණුම් වෙත මාරු කිරීම කළ යුත්තේ, එවැනි අරමුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීමේ අරමුණ සඳහාම නියම කරන ලද ‘විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුමක් (ETRA)’ හරහා පමණි.

4.3 විගාමිකයන්ගේ රුපියල් ගිණුම්වල (ERAs) පවතින අරමුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීම සඳහා හෝ පහත 4.4 වැනි ඡේදය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත මාරු කිරීම සඳහා, එම අරමුදල් විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම් (ETRAs) වෙත මාරු කළ යුතු ය.

4.4 විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුමක (ETRA) ඇති අරමුදල්, ඉහත 3.4 වැනි ඡේදයේ දක්වා ඇති අවසර ලත් සංක්‍රමණ දීමනාවට යටත්ව, එම ගිණුම් හිමියාගේම පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts), ආමුඛ ආයෝජන ගිණුම් (Inward Investment Accounts) හෝ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ව්‍යාපාරය යටතේ (Offshore Banking Business) පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත මාරු කළ හැකිය.

**5. සංක්‍රමණ දීමනාවෙන් අඩු කළ යුතු ගෙවීම්**

5.1 විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම්වලින් (ETRAs) ඉහත 4.4 වැනි ඡේදය යටතේ අදාළ ගිණුම් වෙත අරමුදල් මාරු කිරීමේදී හෝ විදේශ ප්‍රේෂණ සිදු කිරීමේදී, සංක්‍රමණ දීමනාවෙන් පහත සඳහන් ගෙවීම් අඩු කළ යුතුය.

5.1.1 හිමිකම් ඇති සංක්‍රමණ දීමනාව ඉල්ලා සිටින අවස්ථාවේදී, විගාමිකයා ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටියදී විදේශ විනිමය පනත සහ/හෝ අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කර විදේශයන්හි සිදු කරන ලද ආයෝජනවල මුළු වටිනාකම. කෙසේ වෙතත්, එම විදේශ ආයෝජන විකුණා ලබාගත් මුදල් නැවත ශ්‍රී ලංකාවට ගෙන ආ බවට විගාමිකයා විසින් ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කරන්නේ නම්, එම ආයෝජනවල වටිනාකම, සංක්‍රමණ දීමනාවෙන් අඩු නොකළ යුතු ය.

5.1.2 පහත 8.1 ඡේදය යටතේ දක්වා ඇති පරිදි ‘මව්පිය සංක්‍රමණ යෝජනා ක්‍රම’ (Parent Migrations Schemes) සඳහා විගාමික තත්ත්වය අපේක්ෂා කරන තැනැත්තන් විසින් සිදු කරන ලද ගෙවීම්.

5.1.3 නිත්‍ය නේවාසිකත්වය සඳහා සුදුසුකම් ලබන තාවකාලික නේවාසික වීසා බලපත්‍රයක් (Temporary resident visa leading to permanent resident visa) හිමි වයස අවුරුදු දහඅටක් (18) හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පුද්ගලයන් විසින් පහත 8.2 වැනි ඡේදය යටතේ ලබා ගත් මුදල් වල වටිනාකම.

**6. විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම් (ETRAs) සහ විගාමිකයන්ගේ රුපියල් ගිණුම් (ERAs) විවෘත කිරීම සහ පවත්වාගෙන යාම**

6.1 පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන වලට අනුකූලව, ඉතිරි කිරීමේ ගිණුම් හෝ ජංගම ගිණුම් ලෙස එක් විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුමක් (ETRA) පමණක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට පහත සඳහන් පුද්ගලයන් හට අවසර ලබා දෙනු ලැබෙයි.

(අ) විගාමිකයන්

(ආ) වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය සඳහා සුදුසුකම් ලබන තාවකාලික නේවාසික වීසා බලපත්‍රයක් යටතේ විදේශගත වීමට බලාපොරොත්තු වන, වයස අවුරුදු දහඅටක් (18) හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පුද්ගලයන්

(ඇ) මව්පිය සංක්‍රමණ යෝජනා ක්‍රමයක් යටතේ විගාමික තත්ත්වය අපේක්ෂා කරන ශ්‍රී ලාංකික පුද්ගලයන්;

(ඈ) පනතේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කර ඇති, අනේවාසික තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ආයෝජන සම්බන්ධ රෙගුලාසි වල දක්වා ඇති පරිදි, එම ආයෝජන වලින් ලැබෙන ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් වාර්ෂික දීමනාවකට යටත්ව නැවත සිය රටට ගෙනයාමේ අරමුණ සඳහා, නේවාසික හෝ අනේවාසික බාලවයස්කරුවන් ඇතුළු විදේශිකයන්

(ඉ) මියගිය සුදුසුකම් ලත් පුද්ගලයන්ගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක්, එම බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ පොල්මෑකරුවන් හෝ එවැනි සමාන අධිකාරි

(ඊ) මෙම රෙගුලාසිවල අරමුණු සඳහා මහ බැංකුව විසින් කලින් කලට අවසර ලබා දෙනු ලබන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් කාණ්ඩයක්.

6.2 පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන වලට අනුකූලව, ඉතිරි කිරීමේ ගිණුම්, ජංගම ගිණුම් හෝ ස්ථාවර තැන්පතු ලෙස විගාමිකයන්ගේ රුපියල් ගිණුම් (ERAs) විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට පහත සඳහන් පුද්ගලයන් හට අවසර ලබා දෙනු ලැබෙයි.

(අ) විගාමිකයන්

(ආ) පනතේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කර ඇති, අනේවාසික තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ආයෝජන සම්බන්ධ රෙගුලාසි වල දක්වා ඇති පරිදි, එම ආයෝජන වලින් ලැබෙන ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් වාර්ෂික දීමනාවකට යටත්ව නැවත සිය රටට ගෙනයාමට අවසර ඇති, නේවාසික හෝ අනේවාසික බාලවයස්කරුවන් ඇතුළු විදේශිකයන්

(ඇ) මියගිය සුදුසුකම් ලත් පුද්ගලයන්ගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක්, එම බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ පොල්මෑකරුවන් හෝ එවැනි සමාන අධිකාරි

(ඈ) මෙම රෙගුලාසිවල අරමුණු සඳහා මහ බැංකුව විසින් කලින් කලට අවසර ලබා දෙනු ලබන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් කාණ්ඩයක්.

**7. විගාමිකයන්ගේ රුපියල් ගිණුම්වල ඇති අරමුදල් මගින් විගාමිකයන් විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ආයෝජන**

7.1 විගාමිකයන්ට තමන්ගේ විගාමිකයන්ගේ රුපියල් ගිණුම්වල (ERA) ඇති අරමුදල්, එම විගාමිකයන්ගේ ජංගම ආදායම් ද ඇතුළත්ව, අනේවාසික නැතැත්තන් ශ්‍රී ලංකාව තුළ සිදු කරන ආයෝජන සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කර ඇති අදාළ රෙගුලාසි වල අවසර දී ඇති ආයෝජන සිදු කළ හැකි ය.

7.2 එවැනි ආයෝජනවලින් ලැබෙන සියලුම ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම්, එම ආයෝජනය සිදු කිරීමට යොදාගත් අදාළ විගාමිකයන්ගේ රුපියල් ගිණුමටම (ERA) බැර කළ යුතු ය.

**8. විගාමික තත්ත්වය අපේක්ෂා කරන පුද්ගලයන් සිදු කරන අරමුදල් හුවමාරු කිරීම්**

8.1 'මව්පිය සංක්‍රමණික යෝජනා ක්‍රම' යටතේ, වීසා ලබා ගැනීම සඳහා නේවාසික තැනැත්තන් විසින් විදේශීය අධිකාරි වෙත අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව,

අදාළ තැනැත්තන් විසින් විවෘත කරන ලද 'විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම්' (ETRAs) හරහා අරමුදල් ප්‍රේෂණය කළ හැකි ය.

8.2 වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය සඳහා සුදුසුකම් ලබන තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති, වයස අවුරුදු දහඅටක් (18) හෝ ඊට වැඩි නේවාසික හෝ අනේවාසික ශ්‍රී ලාංකිකයින්ට, අදාළ රටෙහි ස්ථාපිත වීම සඳහා අවශ්‍ය මූලික වියදම් සඳහා, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන වලට අනුකූලව, එම තැනැත්තන් විසින් විවෘත කරන ලද විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම් (ETRAs) වලින් උපරිමය ඇමරිකානු ඩොලර් 30,000ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඒ හා සමාන ප්‍රමාණයකට යටත්ව මුදල් ලබා ගත හැකි ය. මෙසේ මුදල් ලබාගත හැකි වන්නේ අදාළ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත්වන අවස්ථාවේදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය දින සිට මාස තුනක (3) කාලයක් ඇතුළතදී පමණි.

**9. අනෙකුත් නියම සහ කොන්දේසි**

9.1 තමා නිත්‍ය නේවාසිකත්වය ලබා ඇති රටේ ස්ථිරවම පදිංචි වීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් බැහැර වීමට අපේක්ෂා කරන විගාමිකයෙක්, ශ්‍රී ලංකාව තුළ තම ගිණුම් පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දන් (Authorised Dealers) වෙත ඒ පිළිබඳ තොරතුරු නොපමාව දැනුම් දිය යුතු ය.

9.2 මෙම රෙගුලාසි බලාත්මක වන දිනට පෙර, විගාමික තත්ත්වයට පත් වූ සහ ඉහත 9.1 වැනි ඡේදයේ සඳහන් පරිදි අදාළ තොරතුරු ශ්‍රී ලංකාවේ තම ගිණුම් පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දන් වෙත ලබා දීමට මෙතෙක් අපොහොසත් වූ විගාමිකයන්, එම තොරතුරු අදාළ බලයලත් වෙළෙන්දන් වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි ලබා දිය යුතු ය.

9.3 එවැනි තොරතුරු ලැබුණු පසු, අදාළ බලයලත් වෙළෙන්දන් විසින් එම තැනැත්තාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විගාමිකයන්ගේ රුපියල් ගිණුම් (ERAs) ලෙස නැවත නාමනය කළ යුතු ය.

**10. ගිණුම් නැවත නාමනය කිරීම**

10.1 පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන වලට අනුකූලව, විගාමිකයන් විසින් දැනට පවත්වාගෙන යනු ලබන සියලුම 'ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්' (Capital Transactions Rupee Accounts), මෙම රෙගුලාසිය බලාත්මක වන දින සිට මාස තුනක් (3) ඇතුළත විගාමිකයන්ගේ ගනුදෙනු රුපියල් ගිණුම් (ETRA) ලෙස නැවත නාමනය කර පවත්වා ගෙන යා යුතු ය.

10.2 පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන වලට අනුකූලව, විගාමිකයන් විසින් දැනට පවත්වාගෙන යනු ලබන සියලුම 'විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම්' (Emigrants' Remittable Income Accounts) සහ 'අනේවාසික රුපියල් ගිණුම්' (Non-Resident Rupee Accounts), මෙම රෙගුලාසි බලාත්මක වන දින සිට මාස තුනක් (3) ඇතුළත 'විගාමිකයන්ගේ රුපියල් ගිණුම්' (ERA) ලෙස නැවත නාමනය කර පවත්වා ගෙන යා යුතුය.

**11. තොරතුරු වාර්තා කිරීම**

බලයලත් වෙළෙන්දන් විසින් මෙම රෙගුලාසි යටතේ සිදු කරන ලද ගනුදෙනු සහ අරමුදල් හුවමාරු පිළිබඳ විස්තර, මේ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන වල දක්වා ඇති පරිදී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත යොමු කළ යුතු ය.

**12. පොදු අනුකූලතා අවශ්‍යතා**

12.1 මෙම රෙගුලාසිවල අරමුණු සඳහා ගනුදෙනු හෝ අරමුදල් ප්‍රේෂණ කිරීම් සිදු කරනු ලබන බලයලත් වෙළෙන්දන් ඇතුළු සෑම තැනැත්තකුම, පනතේ විධිවිධානවලටත්, ඒ යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධානවලටත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අනෙකුත් අදාළ නීතිවලටත් අනුකූලතාව දැක්විය යුතුය.

12.2 මෙම රෙගුලාසි යටතේ ගනුදෙනු හෝ අරමුදල් ප්‍රේෂණ කිරීම් සිදු කරනු ලබන බලයලත් වෙළෙන්දන් විසින් එම ගනුදෙනු හෝ අරමුදල් හුවමාරුවල නීත්‍යානුකූලභාවය සහ සද්භාවය තහවුරු කර ගත යුතු ය.

12.3 පනතේ විධිවිධාන, රෙගුලාසි, නියෝග සහ ඒ යටතේ නිකුත් කරන ලද විධාන පිළිපැදීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන්, පනතේ විධිවිධාන යටතේ අවශ්‍ය යැයි මහ බැංකුව විසින් සළකන යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට මහ බැංකුව විසින් කටයුතු කරනු ඇත.

**13.** නිර්වචන

**මෙම රෙගුලාසිවල අරමුණු සඳහා,**

13.1 **"පනත"** යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් කළ යුතුය;

13.2 **"බලයලත් වෙළෙන්දා"** යන්නට, සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලබා ඇති සහ (විදේශ විනිමය) පනතේ 4 වන වගන්තිය යටතේ බලයලත් වෙළෙන්දකු ලෙස බලය පවරා ඇති බැංකුවක් අදහස් කළ යුතුය;

13.3 **"ප්‍රාග්ධන ගනුදෙනුව"** යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

13.4 **"මහ බැංකුව"** යන්නට, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

13.5 **"නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්"** යන්නෙන්, 2024 ජුනි මස 15 දිනැති 2024 අංක 01 දරන බැංකු (අක් වෙරළ බැංකු කටයුතු (Off-shore Banking)) නියෝගයේ සහ ඉන් පසුව නිකුත් කරන ලද අදාළ නියෝග හෝ සංශෝධනවල අර්ථ දක්වා ඇති ඇති විදේශ මුදල් අදහස් කළ යුතු ය;

13.6 **"සමීපතම පවුලේ සාමාජිකයන්"** යන්නෙන්, විගාමිකයාගේ දෙමව්පියන්, සීයා හෝ ආච්චි (Grandparents), සහෝදර සහෝදරියන්, කාලත්‍රයා සහ දරුවන් අදහස් කළ යුතුය;

13.7 **"බලපත්‍රලාභී වාණිජ බැංකුව"** යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

13.8 **"මව්පිය සංක්‍රමණ යෝජනා ක්‍රමය"** යන්නෙන්, යම් විදේශ රටක නිත්‍ය නේවාසිකත්වය හෝ පුරවැසිභාවය ලබා ඇති තැනැත්තකුගේ ශ්‍රී ලාංකික දෙමව්පියන්ට එම රටේ නිත්‍ය නේවාසිකත්වය ලබා ගැනීමට හැකියාව ලබා දෙමින් එම විදේශ රට විසින් මෙහෙයවනු ලබන යෝජනා ක්‍රමයක් අදහස් කළ යුතු ය.

EOG 06 - 0247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.